# පුරාණ ලංකාවේ පවුල් සංස්ථාවේ ආර්ථිකය කෙරෙහි කාන්තාවගේ දායකත්වය

එස්.ආර් නදීකා කුමුදිනී සිංහබාහු

## සාරාංශය

මානව ප්‍රජාවෙහි පැවැත්මෙහිලා කාන්තා දායකත්වය වඩාත් වැදගත් වූවකි. කාන්තාව පුරාණ ලංකාවේ පවුල් සංස්ථාවෙහි හා ගෘහ ජීවිතයෙහි ආරක්ෂාව උදෙසා ප්‍රබල දායකත්වයක් දක් වූ බව මූලාශ්‍රය අධ්‍යයනයෙන් පැහැදිලි වේ. ඇය බිරිඳක ලෙස ස්වාමි පුරුෂයා වෙත ඉටුවිය යුතු යුතුකම් ද, මවක ලෙස දරුවන් බිහි කොට ආරක්ෂාව සපයමින් පෝෂණය කිරීමේ වගකීම ද, දියණියක ලෙස දෙමාපියන් පෝෂණය කිරීමට ද, තමා සතු ප්‍රධානත ම වගකීමක් ලෙස සලකා කටයුතු කරයි.

පුරාණ ලංකාවේ පැවති කෘෂිකාර්මික අර්ථ ක්‍රමය තුළ විවිධ ආර්ථික දුෂ්කරතා මග හරවා ගනිමින් ආර්ථික සුරක්ෂිතතාවක් මෙන්ම මනා කළමනාකාරිත්වයක් ගොඩනගා ගැනීම උදෙසා කාන්තාවගේ දායකත්වය කෙබඳු ද යන්න විමසීම මෙම පර්යේෂණයෙහි මුඛ්‍ය අරමුණ මෙන්ම පර්යේෂණ ගැටලුව ද විය. ඊට අමතරව, පැරණි ලක්දිව කාන්තාවන් නියැළුණු වෘත්තීන් මොනවාද?, ඒ ඒ වෘත්තීන් තුළ කාන්තා භූමිකාව කෙබඳු වී ද යන්න විමසා බලන අතර ම පවුල් සංස්ථාව තුළ ස්ත්‍රිය මෙන් ම පුරුෂයා සතු කාර්යභාරය විග්‍රහ කොට එහි ස්වභාවය සසඳා බැලීම තුළින් කාන්තාව ආර්ථිකය තුළ දක්වන සම්පත් දායකත්වය පරීක්ෂා කිරීම කෙරෙහි ද මෙම පර්යේෂණයේ දී විශේෂ අවධානය යොමු කර ඇත.

පැරණි ලක්දිව කාන්තාව නොයෙක් ආර්ථික ප්‍රශ්න හමුවේ පවුලේ ආර්ථික සුරක්ෂිතතාවය ගොඩනගා ගැනීම සඳහා විවිධ වූ වෘත්තීන් හා ජීවනෝපාය මාර්ගවල නියැළෙමින් විශාල දායකත්වයක් දක් වූ බවත්, ඒ මත

පවුල තුළ ද ස්වයංපෝෂිත ආර්ථිකයක් ගොඩනැගුණු බවත් මෙහි දී එළඹි උපකල්පනය විය.

මෙම අධ්‍යයනය සඳහා පර්යේෂණ ක්ෂේත්‍රය ලෙස අනුරාධපුර යුගයේ සිට පොළොන්නරු යුගය අවසානය දක්වා වූ කාලය කෙරෙහි අවධානය යොමු කරන ලදී.

මෙහි දී පර්යේෂණ ක්‍රමවේදය ලෙස මූලාශ්‍රය අධ්‍යයනය හෙවත් ඓතිහාසික ක්‍රමවේදය යොදා ගත් අතර එහි දී මහාවංසය, පූජාවලිය, ධාතුවංසය, ධම්පියා අටුවා ගැටපදය වැනි ප්‍රාථමික මූලාශ්‍රය ගණනාවක් හා ද්විතීයික මූලාශ්‍රය, ජනප්‍රවාද, ජනශ්‍රැති ආදිය භාවිත කෙරිණි.

සමස්ත පර්යේෂණය මඟින් එළඹි නිගමනය නම්, විශේෂයෙන් ම පුරාතන ලංකාවේ ඓතිහාසික පසුබිම තුළ කාන්තාව ආර්ථික අංශයට විශාල දායකත්වයක් ලබාදුන් බවයි. මෙහි දී විශේෂත්වය වන්නේ, තමා වෙත පවුල් සංස්ථාව තුළ පැවරුණු වගකීම සියල්ල ඉටු කරමින් ද කාලය නිසිලෙස උපයෝගී කරගනිමින් ද ආර්ථික අංශයට දායක වීමයි. විටෙක, ඇය පුරුෂයා හා සම සාන්තවයෙන් ද තවත් විටෙක පුරුෂයා අතික්‍රමණය කරමින් ද පවුල තුළ ආර්ථික දායකත්වයක් දැක්වූ බව සමස්ත පර්යේෂණය තුළින් නිගමනය කෙරිණි.

**ප්‍රමුඛ පද** : කාන්තාව, ආර්ථිකය, පවුල, ශ්‍රී ලංකාව